ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත

[සහතිකය සටහන් කළේ 2002 දෙසැම්බර් මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2002 දෙසැම්බර් මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 23.00 යි. තැපැල් ගාස්තුව : රු. 9.00 යි.

2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත

[සහතිකය සටහන් කළේ 2002 දෙසැම්බර් මස 18 වන දින]

එල්. ඩී.—ඕ. 6/2000.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පිහිටුවීම සඳහා ද, සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ සියලු දේපළ, ගිවිසුම්, අයිතිවාසිකම් සහ බැඳීම්, ශ්‍රී ලංකා ගුවන් සේවා අධිකාරියට පැවරීම පිණිස ද ; සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කිරීම පිණිස ද ; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරන) දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

I වන කොටස

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පිහිටුවීම සහ එහි සංයුතිය

2. (1) ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පිහිටුවීම

(2) අධිකාරිය, (1) වන උපවගන්තිය මගින් එයට දී ඇති නාමයෙන්, අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් වන අතර එම නාමයෙන් අධිකාරිය විසින් නඩු පැවරීම ද අධිකාරියට විරුද්ධව නඩු කටයුතු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

3. (1) අධිකාරිය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :-

අධිකාරියේ සංයුතිය.

(අ) රාජ්‍ය ආරක්ෂක විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ආ) මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ;

(ඇ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් පස් දෙනෙක් ; එම තැනැත්තන් අතුරින් තැනැත්තන් දෙදෙනකුට නොඅඩු සංඛ්‍යාවක් සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රයේ සැහෙන පළපුරුද්දක් හෝ දැනුමක් ඇති අය විය යුතු ය ; සහ

(ඈ) අධ්‍යක්ෂ ජනරාල්වරයා.

(2) අමාත්‍යවරයා විසින් අධිකාරියේ සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු අධිකාරියේ සභාපතිවරයා ලෙස ද තවත් සාමාජිකයකු එහි උපසභාපතිවරයා ලෙස ද පත් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ සාමාජිකයකු පත් කිරීමේ දී, ඒ සාමාජිකයාට යම් ගුවන් යානා සමාගමක හෝ ගුවන් සේවා හා සම්බන්ධ ව්‍යාපාරයක හෝ, එසේ සාමාජිකයකු ලෙස ඔහුගේ කර්තව්‍ය ඉටු කිරීම කෙරෙහි අගතිදායක බලපෑමක් වීමට ඉඩ ඇති මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවක් නොමැති බවට අමාත්‍යවරයා සෑහීමට පත්විය යුතු ය. තවද ඒ සාමාජිකයකුගේ එවැනි යම් සම්බන්ධතාවක් නොපවතින බවට, අමාත්‍යවරයා කලින් කල සෑහීමට පත් විය යුතු ය.

(4) සභාපතිවරයා වශයෙන් තමා වෙත පැවරී ඇති කටයුත්තක් හෝ කර්තව්‍යයක් ඉටු කිරීම සඳහා සභාපතිවරයා විසින් අධිකාරියේ යම් සාමාජිකයකුට, ලිඛිතව බලය පැවරීමක් මගින් බලය දෙනු ලැබිය හැකි ය.

(5) මේ පනතේ පළමුවන උපලේඛනයේ විධිවිධාන අධිකාරියේ සාමාජිකයන් කෙරෙහි සහ ඔවුන් සම්බන්ධයෙන් ද අධිකාරියේ රැස්වීම් සහ අධිකාරියේ මුද්‍රාව සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

අධිකාරිය විසින් එළඹීමට ඇති යම් තීරණයකට අදාළ සම්බන්ධතාවක් සාමාජිකයන් විසින් හෙළිදරව් කළ යුතු බව.

4. අධිකාරිය විසින් තීරණයකට එළඹීමට තිබෙන අධිකාරියේ යම් ගනුදෙනුවකට හෝ ව්‍යාපෘතියකට සෘජුවම හෝ වක්‍රව හෝ යම් සම්බන්ධතාවක් ඇති අධිකාරියේ සාමාජිකයකු විසින්, එකී තීරණයකට එළඹීම සිදුවන අධිකාරියේ රැස්වීමේ දී, ඔහුගේ සම්බන්ධතාවේ ස්වභාවය හෙළිදරව් කළ යුතු ය. එම හෙළිදරව් කිරීම, ඒ රැස්වීමේ වාර්තාවෙහි වාර්තාගත කළ යුතු අතර, ඉන් අනතුරුව ඒ ගනුදෙනුව හෝ ව්‍යාපෘතිය පිළිබඳව අධිකාරියේ සාකච්ඡාවලට හෝ තීරණවලට ඒ සාමාජිකයා සහභාගි නොවිය යුතු ය.

සීමිත කාලසීමාවනට ඇතැම් කටයුතුවල නිරතවීම තහනම් කිරීම.

5. අධ්‍යක්ෂ ජනරාල්වරයා අධිකාරියේ සාමාජිකයකු වශයෙන් ධුරය දැරීම නතර වීමෙන් පසුව එක් අවුරුද්දක කාලසීමාවක් ඉකුත් වන තෙක්, එසේ සාමාජිකයකු වශයෙන් ධුරය දැරූ කාලය ඇතුළත, අධිකාරියේ නියාමන පාලනයට යටත්ව තිබුණු, ගුවන් සේවා කර්මාන්තයේ කවර හෝ අස්ථිත්වයක් සමග (ගිවිසුම්ගත හෝ අන්‍යාකාර වූ) කිසි සේවා නියුක්තියක් හෝ පැවරුමක් හෝ භාර නොගත යුතු ය.

කමිටු පත් කිරීම.

6. (1) අධිකාරිය විසින්, මේ පනත යටතේ අධිකාරියේ බලතල ක්‍රියාවේ යෙදවීමෙහි ලා ඊට සහාය වීමේ කාර්යය සඳහා, එහි සාමාජිකයන් අතුරෙන් හෝ සුදුසු යයි අධිකාරිය අදහස් කරන තැනැත්තන් අතුරෙන් යෝග්‍ය යයි එය සලකන කමිටු සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකි ය.

(2) අධිකාරිය විසින්, සුදුසු යයි සලකන නියම හා කොන්දේසිවලට යටත්ව, එහි බලතල සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ, (1) වන උපවගන්තිය යටතේ සංස්ථාපනය කරන කවර හෝ කමිටුවකට පවරා දෙනු ලැබිය හැකි අතර, එසේ පවරා දෙනු ලබන බලතල අධිකාරියේ නමින් හෝ අධිකාරිය වෙනුවෙන් ඒ කමිටුව විසින් ක්‍රියාවේ යොදනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ස්වකීය බලතල සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ කමිටුවක් වෙත පවරා දෙනු ලැබුව ද ඒ නොතකා එසේ පවරා දෙන ලද කවර හෝ බලයක්, අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

II වන කොටස

අධිකාරියේ බලතල, කාර්ය හා කර්තව්‍ය

අධිකාරියේ බලතල කාර්ය හා කර්තව්‍ය.

7. අධිකාරිය විසින්, සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවේ බැඳීම්වලට අනුකූලවන ආකාරයෙන් මෙහි පහත දැක්වෙන බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීම කරනු ලැබිය හැකි ය :–

(අ) අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද විධානවලට යටත්ව, ශ්‍රී ලංකාවේ දේශ සීමාව ඇතුළත සිවිල් ගුවන් සේවාවල ක්‍රියාකාරිත්වය සහ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන් යානාවල ශ්‍රී ලංකාවෙන් පිටත ක්‍රියාකාරිත්වය මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූලව විධිමත් කිරීම ;

(ආ) ශ්‍රී ලංකාවේ ජාතික ගුවන් සේවා ප්‍රතිපත්තිය සකස කර ගැනීමෙහි ලා අමාත්‍යවරයාට සහාය වීම ;

(ඇ) එකී ශ්‍රී ලංකාවේ ජාතික ගුවන් සේවා ප්‍රතිපත්තියට සහ ඒ සම්බන්ධයෙන් අමාත්‍යවරයා නිකුත් කරන විධානවලට අනුකූලව, ශ්‍රී ලංකාව සඳහා ගුවන් සේවා සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම ;

(ඈ) සිවිල් ගුවන් සේවා වැඩිදියුණු කිරීම සඳහා උපාය මාර්ගික මග පෙන්වීමක් සැපයීම සහ සම්බන්ධිත සියලු පාර්ශ්වයන්හි කටයුතු සම්බන්ධීකරණය කිරීම ;

(ඉ) ගුවන් ගමනාගමනයේ සුරක්ෂිතභාවය පිළිබඳව පැහැදිලි හා සංක්ෂිප්ත ආරක්ෂක නියමයන්, පරිචයන් හා ක්‍රියාමාර්ග වැඩිදියුණු කර ව්‍යාප්ත කිරීම හෝ යෝග්‍යවන පරිදි ආශ්‍රිතව පිළිගත් ප්‍රමිති සහ ගුවන් ගමනාගමනයේ ආරක්ෂාව පිළිබඳ නියමයන්, පරිචයන් හා ක්‍රියාමාර්ග සෑම තැනැත්තන් විසින් ම පිළිපැදීමට සැලැස්වීමේ සඵල උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම ;

(ඊ) ගුවන් ගමනාගමනයේ සුරක්ෂිතභාවයෙහි වැදගත්කම සහ ගුවන් ගමනාගමනයේ සුරක්ෂිතභාවය පිළිබඳ උසස් ප්‍රමිතියක් පවත්වාගෙන යාමේ වගකීම පිළිබඳව වඩා ඉහළ පිළිගැනීමක් පිළිබඳව ගුවන් සේවා පවත්වන ප්‍රජාව වෙත පරිපූර්ණ හා කාලානුරූප උපදෙස් සැපයීම මගින් සහ එම ප්‍රජාව අතර අවබෝධය වැඩිදියුණු කිරීම මගින් ඔවුන් දිරිමත් කිරීම; සිවිල් ගුවන් සේවා ක්‍රියාකාරකම්වල නියුක්ත තැනැත්තන් සඳහා ගුවන් ගමනාගමනයේ සුරක්ෂිතභාවය පිළිබඳ අධ්‍යාපනයක හා පුහුණුවක් ලබාදීම ;

(උ) මේ පනතේ විධිවිධාන මගින් හෝ යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් හෝ යටතේ නිකුත් කළ යුතු සහතික, බලපත්‍ර, අවසරපත්‍ර සහ වෙනත් යම් නෛතික බලකරයක් හෝ ලේඛන නිකුත් කිරීම ;

(ඌ) ගුවන් යානා අනතුරු හා වෙනත් ඒ හා සම්බන්ධ සිද්ධි පිළිබඳව විමර්ශන ආරම්භ කිරීම ; පිරික්සුම් හා මුදාගැනීම් හා මෙහෙයුම් සැපයීම හා පැවැත්වීම

සංවිධානය සඳහා විධිවිධාන ඇති කිරීම ; ගුවන් යානා ගමනාගමන සුරක්ෂිතභාවයට පවත්නා අවදානම් පිළිබඳ පරීක්ෂණ පවත්වා ඒවාට ප්‍රතිකාර්මික ක්‍රියාමාර්ග යෙදීම ;

(ඒ) ශ්‍රී ලංකාවට සහ ශ්‍රී ලංකාවෙන් වාණිජ ගුවන් සේවා ක්‍රියාත්මක කිරීම හා සංවර්ධනය කිරීම පිළිබඳව විමර්ශන හා පරීක්ෂණ පවත්වා වාර්තා සැපයීම සහ මහජන යහපත පිණිස පොදුවේ ගුවන් ප්‍රවාහනය සංවර්ධනය කිරීම මේ කාර්යය සඳහා ගුවන් ප්‍රවාහන පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය කිරීම, පළ කිරීම හා ප්‍රචාරණය පිණිස පහසුකම් හා සේවා පිහිටුවීම හා සැපයීම ;

(ඒ) ජාත්‍යන්තර ගුවන් සේවා සම්බන්ධ ප්‍රමන්ත්‍රණවල දී සහ සාකච්ඡාවල දී අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන ආකාරයකින් සහාය වීම සහ ගුවන් සේවා ගිවිසුම්වල විධිවිධාන සමීක්ෂණය කිරීම සහ නිසි පරිදි ක්‍රියාත්මක කරන බවට වගබලා ගැනීම ;

(ඔ) අධිකාරිය නිකුත් කරන ප්‍රකාශන මගින් හෝ වෙනත් යම් ක්‍රම මගින් ගුවන් සංතරණය හා ගුවන් ප්‍රවාහනය පිළිබඳ තොරතුරු සැපයීම ; ගගන නාවික සිතියම් හා දර්ශක සටහන් පළ කිරීම ; ගගන නාවික මාර්ග පිහිටුවා ගැනීම සහ නිසි ගගන නාවික තොරතුරු සේවා හා ගගන නාවික විදුලි සංදේශ සේවා සැපයීම පිළිබඳව වගබලා ගැනීම ;

(ඕ) ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවාවන්හි පහසුකම්, ගුවන් ගමනාගමනයේ සුරක්ෂිතභාවය, පරිසර සංරක්ෂණය, අන්තරායදායක භාණ්ඩ ගෙනයාම සහ ගෝලීය වශයෙන් එක හා සමාන තත්වයක් පවත්වාගැනීම හිතකරවන මේ හා සම්බන්ධ වෙනත් ක්ෂේත්‍රවල ප්‍රමිතියක් ක්‍රියාත්මක කර ගැනීම සඳහා, අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව නිශ්චිත වැඩසටහන් ඇතිකර ගැනීම ;

(ක) ශ්‍රී ලංකාව විසින් පිළිගත් ප්‍රමිති ක්‍රියාත්මක කිරීම හා ගිවිසුම් හා වැඩපිළිවෙළවල් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා

සංවිධානය සමග සම්බන්ධීකරණයෙන් ක්‍රියා කිරීම : කලාපීය සහ ලෝක ව්‍යාප්ත ගුවන් සේවා සංවිධානවල ශ්‍රී ලංකාවේ සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම හා අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව, සිවිල් ගුවන් සේවා හා සම්බන්ධ කාරණාවල දී ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකාව නියෝජනය කිරීම හෝ නියෝජනය කිරීමට සැලැස්වීම ;

(ග) සිවිල් ගුවන් සේවාවලට අදාළ කාරණා පිළිබඳව සහ ජාත්‍යන්තර ගුවන් සේවා ගිවිසුම්, සන්ධාන සහ සම්මුති පිළිගෙන ක්‍රියාත්මක කිරීම පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම ;

(ච) අධිකාරිය වෙත යථා පරිදි සතුවන සහ පවරා දෙනු ලබන යම් දේපළක් රජය වෙනුවෙන් අයිතිව සන්තකය දැරීම ;

(ජ) අධිකාරියේ චංචල සහ නිශ්චල යන දෙයාකාරයේම දේපළ, අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව උකස් කර ණය ලබාගැනීම ඇතුළුව, අවස්ථාවෝචිත යයි අධිකාරිය කල්පනා කරන යම් ආකාරයකින් අධිකාරියේ එකී දේපළ උපයෝජනය කිරීම ;

(ට) සිවිල් ගුවන් සේවා ප්‍රවර්ධනය හා සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා තනිවම හෝ වෙනත් සිවිල් ගුවන් සේවා බලධරයන් හෝ ජාත්‍යන්තර නියෝජ්‍යායතන (ඒජන්සි) හෝ සංවිධාන සමග එක්ව කිසියම් ක්‍රියාකාරකමක යෙදීම ;

(ඩ) අධිකාරියේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි භාණ්ඩ, සේවා හෝ ද්‍රව්‍ය සැපයීම හෝ වැඩ කිරීම සඳහා වන ගිවිසුම්වලට හෝ වෙනත් යම් ගිවිසුම්වලට ඇතුළත් වීම ;

(ණ) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන හෝ ඒවා යටතේ නිකුත් කරනු ලබන හෝ දෙනු ලබන සහතික, බලපත්‍ර, අවසර පත්‍ර හෝ වෙනත් යම් නෛතික බලකරයන් හෝ ලේඛන සහ ඒ විධිවිධාන මගින් හෝ ඒවා යටතේ සපයනු ලබන සේවා සඳහා අය කළ යුතු ගාස්තු හා අයකිරීම් සම්බන්ධයෙන් අමාත්‍යවරයා වෙත නිර්දේශ කිරීම ;

(ත) අධිකාරියේ කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය තෝරා සේවයේ නියුක්ත කිරීම සහ කාර්ය මණ්ඩලයේ වැටුප් සහ කාර්ය මණ්ඩල සුභසාධක යෝජනා ක්‍රම හා පුහුණු කිරීමේ වැඩසටහන් ඇතුළුව සේවා නියමයන් හා කොන්දේසි තිරණය කර ක්‍රියාවේ යෙදීම ;

(ද) අධිකාරියේ කර්තව්‍ය කරගෙන යාම සඳහා අවශ්‍ය විය හැකි උපදේශකයන්ගේ සේවය ලබා ගැනීම සහ ඇටෝර්නි බලකරුවන් හා අනුයෝජිතයන් පත් කර ගැනීම ;

(න) අවශ්‍ය සුදුසුකම් ලත් පුද්ගලයන් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදවීම සහ කර්මාන්තයේ ප්‍රමිතිවලට අනුකූල වන පරිදි ඔවුන්ගේ පාරිශ්‍රමික තිරණය කිරීම ;

(ප) මේ පනත යටතේ අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම හෝ කාර්ය කිරීම සඳහා සහ අමාත්‍යවරයා විසින් තත් කාර්ය සඳහා කරන නියමයක් මගින් අධිකාරිය වෙත පවරනු ලබන හෝ අභිනියෝජනය කරනු ලබන යම් කර්තව්‍ය හෝ කාර්ය කිරීම හෝ ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් බලතල ක්‍රියාත්මක කිරීම ;

(බ) සිවිල් ගුවන් සේවාවේ කවර හෝ අංශයන් පිළිබඳව සමීක්ෂණ ආරම්භ කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම ;

(ම) වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ අධිකාරිය වෙත දෙනු ලබන හෝ පවරනු ලබන යම් කාර්ය ඉටු කිරීම ; සහ

(ය) අමාත්‍යවරයා විසින් කලින් කල විධාන කරන වෙනත් යම් කරතව්‍ය ඉටු කිරීම.

අධිකාරිය වෙත දේපළ ආදිය පවරාදීම හා සතුවීම.

8. අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන (මෙහි මින් මතු "පැවරීමේ දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක දී සහ ඉන්පසුව–

(අ) ගුවන් සංතරණ පනතේ 20 වන වගන්තිය යටතේ පත් කරන ලද සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා

වෙත පවරා දී ඇති සහ සතු වී ඇත්තා වූ ද පැවරීමේ දිනයට පෙරාතුව ම දිනයේ දී ඔහු සන්තකයේ පවතින්නා වූ සියලු වංචල හා නිශ්චල දේපළ ඒ දිනයේ සිට බලපවත්වන පරිදි, අධිකාරිය වෙත පැවරී සතු වන්නේ ය ;

(ආ) ගුවන් සංතරණ පනතේ 20 වන වගන්තිය යටතේ පත්කරන ලද සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, සමග හෝ සඳහා ඇතුළත් වී ඇත්තා වූ ද පැවරීමේ දිනයට පෙරාතුව ම දිනයේ දී බලසහිතව පවතින්නා වූ ද සියලු ගිවිසුම්, බදු හෝ කුලී නිවැසි ගිවිසුම්, ඒ දිනයේ පටන් අධිකාරිය විසින්, සමග හෝ සඳහා ඇතුළත් වී තිබෙන ගිවිසුම්, බදු හෝ කුලී නිවැසි ගිවිසුම් සේ සැලකෙන්නේ ය ; සහ

(ඇ) පැවරීමේ දිනයට පෙරාතුව ම දිනයේ බලසහිතව පවත්වන්නා වූ ගුවන් සංතරණ පනතේ 20 වන වගන්තිය යටතේ පත් කරන ලද සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සියලු අයිතිවාසිකම්, බැඳීම්, සම්බන්ධතා, ණය හා බැරකම්, ඒ දිනයේ පටන් අධිකාරියේ අයිතිවාසිකම්, බැඳීම්, සම්බන්ධතා, ණය හා බැරකම් සේ සැලකෙන්නේ ය.

දෙවන හා තුන්වන උපලේඛනවල නිශ්චය කොට දැක්වෙන ගගන යාත්‍රාංගන සහ ඇතැම් ගොඩනැගිලි හා ඉඩම් පවරාදීම.

9. මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ගගන යාත්‍රාංගන සහ තුන්වන උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ගගන නාවික පහසුකම් සහ ඒ ගගන යාත්‍රාංගනවලට ආබද්ධ ඉඩම්, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මඟින් අධිකාරිය වෙත පවරා සතුකර දෙනු ලැබිය හැකි ය. මෙම උපලේඛනවල නිශ්චය කොට දැක්වෙන එකිනෙක ගගන යාත්‍රාංගන සහ ගගන නාවික පහසුකම් සහ ඒ ගගන යාත්‍රාංගනවලට ආබද්ධ ඉඩම් පැවරීම සහ සතුකර දීම සම්බන්ධව වෙන් වෙන් නියමයන් කරනු ලැබිය හැකි ය.

ණය සහ බැරකම් අයකර ගැනීමට අධිකාරිය සතු අයිතිවාසිකම්.

10. ගුවන් සංතරණ පනතේ 20 වන වගන්තිය යටතේ පත් කරන ලද සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සපයන ලද සේවා සඳහා හෝ ඒ සේවා වෙනුවෙන් හෝ පැවරීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී එම සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලැබිය යුතුව සහ ගෙවිය යුතුව

තිබුණු යම් මුදල් ප්‍රමාණයක් හෝ එවැනි පැවරීමක් සිදු නොවූයේ නම් එකී පැවරීමේ දිනයට පසුව, රජයට ලැබිය යුතු වන යම් මුදල් ප්‍රමාණයක් ලබා ගැනීමට සහ අයකර ගැනීමට අධිකාරියට අයිතිය තිබිය යුත්තේ ය.

III වන කොටස

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම සහ ඔහුගේ බලතල හා කාර්ය

11. (1) සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ පළපුරුද්දක් හෝ දැනුමක් තිබීම වඩාත් යෝග්‍ය යයි සැලකෙන, නිසි හා සුදුසු තැනැත්තකු අමාත්‍ය මණ්ඩලය විසින්, අමාත්‍යවරයාගේ නිර්දේශය මත, (මේ පනතේ 'අධ්‍යක්ෂ ජනරාල්' යනුවෙන් සඳහන් කරනු ලබන) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය. ඔහු අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය. සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම සහ ඔහුගේ බලතල හා කාර්ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා, අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය යුතු සේවා නියුක්ත නියමයන්ට හා කොන්දේසිවලට යටත් විය යුතු අතර, මේ පනතින් හෝ මේ පනත යටතේ නැතහොත් වෙනත් යම් ලිඛිත නීතියක් මඟින් හෝ යටතේ හෝ පැවරී ඇති කාර්ය සහ කර්තව්‍ය ඉටු කළ යුතු ය : තවද අධිකාරියේ කර්තව්‍ය පිළිබඳ පොදු පරිපාලනය ඔහුට භාර විය යුතු ය.

(3) අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ඇතිව හැර අධ්‍යක්ෂ ජනරාල්වරයා ධුරයෙන් ඉවත් නොකළ යුතු ය.

(4) රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහු නොපැමිණ සිටින කාලසීමාව සඳහා අමාත්‍ය මණ්ඩලය විසින්, අමාත්‍යවරයාගේ නිර්දේශය මත, සහ මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන පිළිබඳව සැලකිලිමත්ව, ඔහු වෙනුවට කටයුතු කිරීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

IV වන කොටස

මුදල්

අධිකාරියේ අරමුදල.

12. (1) අධිකාරියට එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) (අ) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන යටතේ නිකුත් කරනු ලබන යම් සහතික, බලපත්‍ර, අවසරපත්‍ර හෝ වෙනත් නෛතික බලකරයන් නිකුත් කිරීම, වලංගු කිරීම, අලුත් කිරීම, දීර්ඝ කිරීම සහ වෙනස් කිරීම සඳහා ගාස්තු වශයෙන් අවස්ථාවෝචිත පරිදි අධිකාරිය විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අය කරනු ලබන සියලු මුදල් ;

(ආ) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ අධිකාරිය විසින් සපයනු ලබන සේවා සඳහා ගාස්තු වශයෙන් අයකරනු ලබන අවස්ථාවෝචිත පරිදි අධිකාරියට හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ලැබෙන සියලු මුදල් ;

(ඇ) අධිකාරිය විසින් මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන යටතේ එහි බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටු කිරීමේදී අධිකාරියට ලැබෙන සියලු මුදල් ;

(ඈ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ; සහ

(ඉ) ණය මුදල්, පරිත්‍යාග, ත්‍යාග සහ ප්‍රදාන වශයෙන් තවර හෝ ප්‍රභවයකින් අධිකාරියට ලැබෙන සියලු මුදල්,

අධිකාරියේ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) (අ) මේ පනත යටතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හා ඉටු කිරීමේ දී අධිකාරිය විසින් කරනු ලබන වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් ;

(ආ) සම්මුතිය යටතේ පිහිටුවන ලද ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයට හෝ වෙනත් යම් ජාත්‍යන්තර සංවිධානයකට, ශ්‍රී ලංකාවේ දායක මුදල වශයෙන් ගෙවිය යුතු සියලු මුදල් ; සහ

(ඇ) මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක යම් විධිවිධානයක් අනුව අරමුදලින් ගෙවීමට බලය දී ඇති හෝ ගෙවිය යුතු යයි නියමිත වෙනත් යම් වියදම් සඳහා අවශ්‍ය සියලු මුදල්,

අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

අධිකාරිය විසින් ගිණුම් පවත්වාගෙන යා යුතු බව.

13. අධිකාරිය විසින් යෝග්‍ය යයි අදහස් කරන බැංකුවක හෝ බැංකුවල, එය විසින් ගිණුමක් හෝ ගිණුම් විවෘත කර පවත්වාගෙන යා හැකි අතර, රාජ්‍ය සංස්ථාවල මූල්‍ය ගණුදෙනුවලට අදාළව පවත්නා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි වලට අනුකූලව ඒ ගිණුමේ හෝ ගිණුම්වල ගනුදෙනු කටයුතු කරනු ලැබිය යුතු ය.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය.

14. (1) ලිත් වර්ෂය, අධිකාරියේ මුදල් වර්ෂය විය යුතු ය.

(2) අධිකාරියේ ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු මුදල් ගනුදෙනු සම්බන්ධයෙන්, අධිකාරිය විසින්, නිසි ගිණුම් පොත් තබා ගැනීමට සැලැස්විය යුතු ය.

(3) අධිකාරියේ මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් තත්ත්වය පිළිබඳව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කිරීමේ කාර්යය සඳහා, (2) වන උපවගන්තිය යටතේ ගිණුම්, අධිකාරිය විසින් 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත යටතේ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනය විසින් සම්මත කර ගෙන තිබෙන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව, සකස් කරනු ලැබිය යුතු ය.

(4) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනයට සම්බන්ධ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, අධිකාරියේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

වාර්ෂික වාර්තාව.

15. (1) එක් එක් මුදල් වර්ෂය අවසානයේ දී ඒ මුදල් වර්ෂය ඇතුළත අධිකාරිය විසින් කරන ලද අධිකාරියේ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාවක්, අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර මෙහි පහත සඳහන් ඒ වර්ෂයට අදාළ එක් එක ලේඛනයේ පිටපතක් ද අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතු ය.

(අ) විගණකාධිපති වාර්තාව ;

(ආ) විගණනය කළ ශේෂ පත්‍රය ;

(ඇ) විගණනය කළ මෙහෙයුම් ගිණුම (ඔපරේටිං එකවුන්ට්) ; සහ

(ඈ) මුදල් ලැබීම පිළිබඳ ප්‍රකාශය.

(2) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද ලේඛනවල පිටපත් අමාත්‍යවරයා විසින් ඒ වාර්තාව හා ගිණුම් අදාළ වන වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේ අවසානයට පෙර, පාර්ලිමේන්තුව හමුවේ තැබීමට සැලැස්විය යුතු ය.

ආරමුදල් ආයෝජනය.

16. අධිකාරියට අයත් මුදල්, ආණ්ඩුව අනුමත කළ සුරැකුම්පත්වල, අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව සහ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ආයෝජනය කරනු ලැබිය හැකි ය.

ණය ගැනීමට අධිකාරියට ඇති බලය.

17. අධිකාරිය විසින්, අමාත්‍යවරයාගේ සහ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් වූ එකඟත්වය ඇතිව සහ දෙන ලද පොදු අධිකාරයක නියමයන්ට අනුකූලව, අධිකාරියේ බැඳීම් සපුරාලීම සඳහා හෝ මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අධිකාරියට අවශ්‍ය විය හැකි යම් මුදල් ප්‍රමාණයන් අයිරා වශයෙන් හෝ අන්‍යාකාරයෙන්, ණය ලබා ගැනීම හෝ ණය නියමයන් මත මුදල් ලබා ගැනීම හෝ ලබා ගැනීමට කටයුතු කිරීම හෝ කරනු ලැබිය හැකි ය : එසේ වුවද මේ වගන්තිය යටතේ අධිකාරිය විසින් ලබා ගන්නා ලද කවර හෝ ණය මුදල් වෙනුවෙන් ගෙවීමට තිබෙන සමස්ත මුදල කිසි අවස්ථාවක, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් මුදල් ප්‍රමාණයක් නොඉක්මවිය යුතු ය.

V වන කොටස

අධිකාරියේ කාර්ය මණ්ඩලය

අධිකාරියේ කාර්ය මණ්ඩලය.

18. (1) ස්වකීය කටයුතු කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි අධිකාරිය විසින් සලකනු ලබන්නා වූ නිලධරයන් හා සේවකයන් අධිකාරිය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අධිකාරියට පත් කරනු ලබන නිලධරයන් හා සේවකයන් සම්බන්ධයෙන් අධිකාරිය විසින්,-

(අ) විනය පාලනය ක්‍රියාවේ යෙදීම හෝ ඒ නිලධරයන් හා සේවකයන් සේවයෙන් පහකිරීම ;

(ආ) ඒ නිලධරයන්ට සහ සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික ගෙවීම් අනුප්‍රමාණයන් නියම කිරීම ;

(ඇ) ඒ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ සේවයේ යෙදවීමේ නියමයන් හා කොන්දේසි නිශ්චය කිරීම ; සහ

(ඈ) ඒ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ ප්‍රතිලාභය සඳහා කාර්ය මණ්ඩල සුභසාධන හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ එවැනි යම් යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවීම,

කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් සියලු කාරණා සම්බන්ධයෙන් හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් අධිකාරිය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

19. (1) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු, අධිකාරියේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන යම් කාලසීමාවක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස්කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ නිලධරයන් අධිකාරියේ සේවයේ නියුක්ත කිරීම.

20. (1) මේ වගන්තියෙහි "දෙපාර්තමේන්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන, සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින්නා වූ ද, අධිකාරියේ සේවානියුක්තිය ඉල්ලා සිටින්නා වූ ද යම් රජයේ නිලධරයකු අධිකාරිය විසින් සේවයේ යොදවනු ලැබිය හැකි අතර, එම සේවානියුක්තිය සම්බන්ධයෙන් මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අධිකාරියට පත් කරනු ලබන, දෙපාර්තමේන්තුවේ සේවය කරන අවසාන දිනයේ දී අවුරුදු දහයකට නොඅඩු විශ්‍රාම වැටුප් සහිත සේවයක් ඇති, දෙපාර්තමේන්තුවේ සේවය කරන සෑම රජයේ නිලධරයකුම ඒ දිනයේ දී රජයේ සේවයෙන් විශ්‍රාම ගන්නා ලද ලෙස සැලකිය යුතු අතර, තනතුර අහෝසි කිරීමේ හේතුව මත එම දිනයේ දී ඔහු විශ්‍රාම ලැබුයේ නම් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ප්‍රදානය කරනු ලැබිය හැකිව තිබුණු විශ්‍රාම වැටුප ලැබීමට ඔහු සුදුස්සකු විය යුතු ය.

(3) අවුරුදු දහයකට අඩු විශ්‍රාම වැටුප් සහිත සේවයක් ඇති රජයේ නිලධරයකු (1) වන උපවගන්තිය යටතේ අධිකාරියට පත් කරනු ලැබූ අවස්ථාවක, ඔහු දෙපාර්තමේන්තුවේ සේවය කරන අවසාන දිනයේ දී රජයේ සේවයෙන් විශ්‍රාම ලැබූ ලෙස සැලකිය යුතු අතර, තනතුර අහෝසි කිරීමේ හේතුව මත එම දිනයේ දී විශ්‍රාම ලැබුවේ නම් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ප්‍රදානය කරනු ලැබිය හැකිව තිබුණු පාරිතෝෂිකය ලැබීමට ඔහු සුදුස්සකු විය යුතු ය.

(4) (අ) මේ වගන්තියේ (3) වන උපවගන්තියෙහි කවර විධිවිධානයක් තිබුණ ද ඒ උපවගන්තිය යටතේ රජයේ නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයේ තනතුරකට පත් කරනු ලැබ, අදාළ කාලසීමාවට නොඅඩු කාල සීමාවක් ඒ තනතුරෙහි සේවය කළ අවස්ථාවක, අදාළ කාලසීමාව තුළ ඒ තැනැත්තා හෝ තැනැත්තිය අධිකාරියෙහි කළ සේවය විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්ය සඳහා ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත සේවයක් ලෙස සැලකිය යුතු ය.

(ආ) මේ උපවගන්තිය අදාළවන තැනැත්තකු තනතුර අහෝසි කිරීමේ හේතුව මත, අදාළ සේවාකාලය අවසානයේ දී රජයේ සේවයෙන් විශ්‍රාම ලැබුයේ නම්, ඔහුට ලැබිය හැකිව තිබුණු විශ්‍රාම වැටුපට සමාන මුදලක විශ්‍රාම වැටුපක්, අදාළ සේවාකාලය අවසානයේ දී ප්‍රදානය කරනු ලැබීමට ඒ තැනැත්තා සුදුස්සකු විය යුතු ය.

(ඇ) මේ උපවගන්තියේ කාර්ය සඳහා "අදාළ සේවා කාලසීමාව" යන්නෙන් යම් තැනැත්තකු විසින්, රජයේ සේවයෙහි අවුරුදු දහයක විශ්‍රාම වැටුප් සහිත සේවයක් සම්පූර්ණ කිරීම සඳහා, අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබූ දිනයෙන් පසු රාජ්‍ය සේවයේ රැඳී සිටියේ නම්, සේවය කළ යුතුව තිබුණු කාලසීමාව අදහස් වේ.

(5) මේ වගන්තියේ මීට ඉහතින් ඇති විධිවිධාන එසේම තිබුණ ද එමෙන්ම වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද; දෙපාර්තමේන්තුවේ රජයේ නිලධරයකු මේ වගන්තිය යටතේ අධිකාරියේ සේවා නියුක්තයකු බවට පත්වූ විට–

(අ) ඒ නිලධරයා විශ්‍රාම වැටුපක් ලැබීම සඳහා සුදුස්සෙක් වූයේ නම්, ඔහු අධිකාරියේ සේවයේ නියුක්තව සිටින කාලසීමාව තුළ ඔහුට ඒ විශ්‍රාම වැටුප ගෙවනු නොලැබිය යුතු ය ;

(ආ) ඒ නිලධරයා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2අ (1) (i) වන වගන්තියේ විධිවිධාන යටතේ පාරිතෝෂිකයක් ලැබීමට සුදුස්සෙක් වන්නේ නම් ඔහු අධිකාරියේ සේවයේ නියුක්ත කාලසීමාව ඇතුළත ඒ පාරිතෝෂිකය ඔහුට ගෙවනු නොලැබිය යුතු අතර, එය

ඔහු අවස්ථාවෝචිත පරිදි, අධිකාරියේ සේවයේ නියුක්ත වූ පළමු දිනයේ දී හෝ විශ්‍රාම වැටුපක් ලැබීම සඳහා ඔහු සුදුස්සකු වූ දිනයේ දී මේ පනතේ 18 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඈ) ඡේදය යටතේ පිහිටුවන ලද සුභ සාධන හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයේ ඔහුගේ ගිණුමට බැර කරනු ලැබිය යුතු අතර, ඒ මුදල ඒ දිනයේ දී එම ගිණුමට බැර කරනු නොලැබුවහොත්, අවස්ථාවෝචිත පරිදි ඔහු අධිකාරියේ සේවයේ නියුක්ත වූ පළමු දිනයේ සිට හෝ විශ්‍රාම වැටුපක් ලැබීම සඳහා ඔහු සුදුස්සකු වූ දිනයේ සිට, ඒ මුදල ඒ ගිණුමට බැර කරනු ලබන දිනය දක්වා, එකී මුදල සඳහා වර්ෂයකට සියයට දහය බැගින් පොලියක්, එකී මුදල එම ගිණුමට බැර කරනු ලැබීමේ දී ඊට එකතු කළ යුතු ය.

ඉහත කී ව්‍යවස්ථා සංග්‍රහයේ 2ඇ(i) (ii) වන වගන්තියේ සඳහන් "විශ්‍රාම ලැබූ දිනයේ සිට අවුරුදු දහයක්" යන කාලසීමාව ගණන් බැලීමේ කාර්යය සඳහා විශ්‍රාම ගැනීමේ දිනය, ඔහු අධිකාරියේ සේවයේ නියුක්තව සිටි අවසාන දිනය, විශ්‍රාම ගැනීමේ දිනය ලෙස සැලකිය යුතු ය ; සහ

(ඇ) ඒ නිලධරයාට රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ යම් මුදල් ප්‍රමාණයක් ලැබීමට සුදුසුකම් ඇත්නම් ඒ මුදල ඔහුට ගෙවනු නොලැබිය යුතු අතර එය අධිකාරියේ අනුමත කළ අරමුදලක ඔහුගේ ගිණුමට බැර කරනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ (3) වන උපවගන්තියේ කවර විධිවිධානයක් තිබුණ ද, එකී උපවගන්තියෙහි සඳහන් තැනැත්තකු විශ්‍රාම වැටුපක් ලැබීම සඳහා සුදුස්සකු වන අවස්ථාවක දී, ඒ තැනැත්තා එම උපවගන්තිය යටතේ පාරිතෝෂිකයක් ලැබීම සඳහා හිමිකමක් නොලබන්නේ ය.

VI වන කොටස

වැරදි හා දණ්ඩන

21. (1) අධිකාරියට අයත් යම් දේපළක් සිතාමතාම ඉවත් කරන, විනාශ කරන හෝ ඊට හානි කරන නැතහොත් එය පාවිච්චි කිරීමට හෝ ක්‍රියා කරවීමට අපේක්ෂිත ආකාරයට එය පාවිච්චි කරනු ලැබීමට හෝ ක්‍රියාකරවනු ලැබීමට බාධා කරන හෝ එය වළක්වන සෑම තැනැත්තෙක් ම වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට එස්. ඩී. ආර්. දසදහසකට අනුරූප ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණයක් නොඉක්මවන දඩයකට හෝ මාස දෙකක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

අධිකාරියේ දේපළ වලට හානි කිරීම වරදක් බව.

(2) (1) වන උපවගන්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් යම් නඩු පැවරීමක දී අධිකාරිය විසින් තත්කාර්ය සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විටක, ඒ උපවගන්තියේ සඳහන් දණ්ඩනයට අතිරේකව, සිදු කර තිබෙන අලාභය වෙනුවෙන් වන්දි වශයෙන් ආඥාවෙහි නිශ්චය කරනු ලැබිය හැකි යම් මුදලක් වූදිතයා විසින් අධිකාරියට ගෙවිය යුතු බවට, අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

22. මේ පනතේ විධිවිධාන යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද නියෝග හෝ රීති යටතේ හෝ ස්වකීය කාර්ය ඉටු කිරීමෙහි ලා ක්‍රියා කරන අධිකාරියේ යම් නිලධරයකුට හෝ සේවකයකුට අවහිර කරන හෝ බාධා කරන සෑම තැනැත්තෙක් ම වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට එස්. ඩී. ආර්. දස දහසකට අනුරූප ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණයක් නොඉක්මවන දඩයකට හෝ මාස දෙකක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

නිලධරයකුට හෝ සේවකයකුට අවහිර කිරීම හෝ බාධා කිරීම වරදක් බව.

23. 32 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරන ලද ලිඛිත ඉල්ලීමක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින හෝ අසත්‍ය තොරතුරු හෝ යම් අසත්‍ය වාර වාර්තාවක් සපයන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට එස්. ඩී. ආර්. දස දහසකට අනුරූප ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණයක් නොඉක්මවන දඩයකට හෝ මාස දෙකක්

තොරතුරු සැපයීම පැහැර හැරීම.

නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

අධිකාරියේ දේපළවලට සිදු රන හානි සඳහා කරගැනීම.

24. (1) යම් ගුවන් යානාවක් මගින් හෝ ගුවන් යානාවක් තුළ හෝ ගුවන් යානාවක් සම්බන්ධව සේවයේ නියුක්ත යම් තැනැත්තකු විසින් හෝ අධිකාරියේ යම් දේපළකට කවර හෝ අලාභයක් සිදු කරනු ලැබූ සෑම අවස්ථාවක ම ඒ අලාභය යථාවත් වීමේ පිරිවැය ඒ ගුවන් යානාවේ අයිතිකරුගෙන්, ක්‍රියාකරුගෙන් හෝ එය භාරව සිටින තැනැත්තාගෙන් හෝ එක්ව හෝ වෙන් වෙන්ව නැතහොත් එක්ව සහ වෙන් වෙන්ව අධිකාරිය විසින් අයකර ගනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් පරිදි අලාභ අයකර ගැනීමේ ක්‍රියාවලියේ දී, අවශ්‍ය අවස්ථාවක, එම අලාභය යථාවත් කිරීමේ පිරිවැය අධිකාරියට ගෙවනු ලබන තෙක්, හෝ අයවිය යුතු මුදල සඳහා පිරිවැය ආවරණය වීමට ප්‍රමාණවත් යයි අධිකාරිය විසින් තීරණය කරනු ලබන යම් ඇපයක් ලබා දෙන තුරු, අධිකාරිය විසින් ඒ ගුවන් යානය රඳවා තබා ගනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ රඳවා තබාගන්නා යම් ගුවන් යානයක් වෙනුවෙන් ගෙවිය යුතු යම් අයකිරීම් හෝ ගාස්තු සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් හෝ අත්හැරීම යෝග්‍ය යයි අධිකාරිය සලකන අවස්ථාවන් හි දී, අධිකාරිය විසින් එසේ අත්හරිනු ලැබිය හැකි ය.

පොදු දණ්ඩනය.

25. (1) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද නියෝගයක් හෝ රීතියක් උල්ලංඝනය කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) මේ පනතින් ප්‍රකාශිතව දණ්ඩනයක් නියම කර නොමැති යම් වරදක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ වරදකරු වන යම් තැනැත්තකු මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට ඒ තැනැත්තා එස්. ඩී. ආර්. දස දහසකට අනුරූප ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණයක් නොඉක්මවන දඩයකට හෝ මාස දෙකක් නොඉක්මවන කාලයකට දෙ ආකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

26. අධිකාරිය විසින්, යම් වරදක් සිදු කිරීමට අදාළ අවස්ථාගත කරුණු සැලකිල්ලට ගෙන, ඒ වරද සම්බන්ධයෙන් පැනවිය හැකි උපරිම දඩ මුදලෙන් තුනෙන් එකක් නොඉක්මවන මුදලකට මේ පනත යටතේ සිදුකරන ලද වරදක් සමථයකට පත් කළ හැකි අතර, අදාළ වරදකරුට එරෙහිව නඩු පැවරීමක් කර ඇත්නම්, ඒ වරද සමථයට පත් කිරීම නඩු තීන්දුව සටහන් කරනු ලැබීමට පෙර කවර අවස්ථාවක වුව ද අධිකරණයේ අවසරය ලබාගෙන, අධිකාරිය විසින් කරනු ලැබිය යුතු ය. වැරදි සමථයට පත් කිරීම.

27. මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද නියෝගයක් හෝ රීතියක් යටතේ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබූ අවස්ථාවක– පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරන වැරදි.

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ වරද සිදු කරන අවස්ථාවේ ඒ පුද්ගල මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු, සාමාන්‍යාධිකාරිවරයකු, ලේකම්වරයකු හෝ ඒ පුද්ගල මණ්ඩලයේ ඒ සමාන නිලධරයකුව සිටි සෑම තැනැත්තෙක් ම ද ;

(ආ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නොවේ නම්, ඒ වරද සිදු කරන අවස්ථාවේ එහි සභාපති, කළමනාකරු, ලේකම් හෝ වෙනත් ඒ සමාන නිලධරයකුව සිටි සෑම තැනැත්තෙක් ම ද

ඒ වරද සිදු කරන ලද්දේ තමාගේ අනුදැනුමක් නොමැතිව බව හෝ ඒ වරද වැළැක්වීම සඳහා තමා සියලු උද්යෝගයෙන් ක්‍රියා කළ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

28. මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද නියෝගයක් යටතේ හෝ යම් වරදක් නීතිපතිවරයාගේ අනුමතය ඇතිව හැර, කිසිම අධිකරණයක් විසින් සංජ්ඥේයත්වයට නොගත යුතු ය. නීතිපතිවරයාගේ අනුමතය අවශ්‍ය බව.

VII වන කොටස

සාමාන්‍ය කරුණු

රහස්‍ය භාවය පිළිබඳ ප්‍රකාශය.

29. අධිකාරියේ සෑම සාමාජිකයෙක්ම සහ අධිකාරියේ සෑම නිලධරයන් හා සේවකයන් ස්වකීය රාජකාරි ආරම්භ කිරීමට පෙර, ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී හෝ බලතල ක්‍රියාත්මක කිරීමේ දී තමාට දැනගැනීමට ලැබෙන අධිකාරියේ කටයුතුවලට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් තදින්ම රහස්‍ය භාවය සුරකින බවට පොරොන්දු වෙමින් ප්‍රකාශයක් අත්සන් කළ යුතු අතර-

(අ) එවැනි යම් කරුණක් හෙළි කරන ලෙස යම් අධිකරණයක් විසින් නියම කරනු ලැබූ විට හැර ; හෝ

(ආ) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ බලතල ක්‍රියාත්මක කිරීමේ හෝ කාර්ය ඉටු කිරීමේ කාර්ය සඳහා හැර

එවැනි යම් කරුණක් හෙළි නොකරන බවට එම ප්‍රකාශය මගින් පොරොන්දු විය යුතු ය.

බලතල පැවරීම.

30. (1) අධිකාරිය විසින්, මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් යටතේ හෝ එහි බලතල, කාර්තව්‍ය හෝ කාර්ය අතුරෙන් කිසිවක්, අධිකාරියේ යම් නිලධරයකු හෝ සේවකයකු වෙත, ලියවිල්ලක් මගින්, ඒ ලියවිල්ලේ නිශ්චිතව සඳහන් යම් කොන්දේසිවලට යටත්ව පවරා දෙනු ලැබිය හැකි අතර, එවැනි යම් නිලධරයකු හෝ සේවකයකු, අධිකාරියේ නමින් හා අධිකාරිය වෙනුවෙන් ඒ බලතල ක්‍රියාත්මක කිරීම, කර්තව්‍ය කිරීම හෝ කාර්ය ඉටු කිරීම කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පවරා දීමක් කරනු ලැබුව ද, එසේ පවරා දෙනු ලැබූ බලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක් අධිකාරිය විසින් තවදුරටත් ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටුකිරීම කරනු ලැබිය හැකි ය. එසේ ම යම් බලය පවරාදීමක් අධිකාරිය විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

අමාත්‍යවරයා විසින් කරන විධාන.

31. (1) අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය කිරීම, සහ කර්තව්‍ය ඉටුකිරීම සම්බන්ධයෙන්, අමාත්‍යවරයා විසින්, කලින් කල යම් පොදු හෝ විශේෂ විධාන ලිඛිතව අධිකාරියට දෙනු ලැබිය හැකි අතර, ඒ විධාන ක්‍රියාවට නැංවීම අධිකාරියේ කාර්යය විය යුතු ය.

(2) අධිකාරියේ කටයුතු සම්බන්ධයෙන් වාර වාර්තා, ගිණුම් සහ වෙනත් යම් තොරතුරු අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන ආකාරයට සපයන ලෙස, ඔහු විසින් කලින් කල අධිකාරියට විධාන කළ හැකි අතර එවැනි යම් විධාන ඉටු කිරීම අධිකාරියේ කාර්යය විය යුතු ය.

වාර වාර්තා සහ තොරතුරු.

32. (1) අධිකාරියට මේ පනත යටතේ එහි බලතල කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, කිරීමට හා ඉටු කිරීමට හැකිවනු සඳහා, අධිකාරිය විසින් හෝ තත් කාර්යය සඳහා අධිකාරිය විසින් බලය දෙනු ලැබූ තැනැත්තකු විසින්, ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කාල සීමාවක් ඇතුළත, එහි නිශ්චිතව සඳහන් වාර වාර්තා හෝ තොරතුරු අධිකාරිය වෙත හෝ ඉහත කී පරිදි බලය දෙනු ලැබූ තැනැත්තා වෙත හෝ සපයන ලෙස යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය.

(2) යම් වාර්තාවක් හෝ තොරතුරු හෝ සපයන ලෙස (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමක් මගින් යම් තැනැත්තකුට නියම කරනු ලැබූ විට, ඒ වාර වාර්තා සැපයීම හෝ ඒ තොරතුරු හෙළිදරව් කිරීම යම් නීතියක විධිවිධාන යටතේ වැළැක්වී ඇති අවස්ථාවක හැර, ඒ දැන්වීමේ නිශ්චිතව දැක්වෙන කාලසීමාව ඇතුළත ඒ ඉල්ලීම අනුව ක්‍රියා කිරීම ඒ තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

(3) අධිකරණයක් විසින් නියම කරනු ලැබූ අවස්ථාවක හෝ මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වූ බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, හෝ ඉටු කිරීම සඳහා හෝ හැර, (1) වන උපවගන්තිය යටතේ ලබාගත් වාරවාර්තා හෝ තොරතුරු අධිකාරිය විසින් හෝ එහි සාමාජිකයකු විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධිකාරියේ යම් නිලධරයකු නැතහොත් සේවකයකු විසින් හෝ යම් තැනැත්තකුට හෙළිදරව් කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම හෝ නොකළ යුතු ය.

එස්. ඩී. ආර් හා අනුරූප ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණය.

33. මේ පනතේ VI වන කොටස යටතට ගැනෙන වරදක් සම්බන්ධයෙන් දඩයක් නියම කිරීමේ කාර්යය සඳහා එස්. ඩී. ආර්. වලට අනුරූප ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණය තීරණය කිරීම, ඒ දඩය නියම කරනු ලබන වරද සිදු කළ දිනට පෙර දිනය සඳහා එස්. ඩී ආර්. වලට අනුකූලව තීරණය කළ රුපියලේ වටිනාකමෙහි පදනම මත, තීරණය කරනු ලැබිය යුතු ය.

සාමාජිකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

34. අධිකාරියේ සියලු සාමාජිකයන්, අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හා නිලධරයන් හා සේවකයන්, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අධිකාරිය උපලේඛනගත ආයතනයක් සේ සැලකිය යුතු බව.

35. අධිකාරිය, අල්ලස් පනතේ අර්ථානුකූලව සහ ඒ පනතේ විධිවිධාන අනුව, උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපළ අත්කර ගැනීම.

36. (1) අධිකාරියේ යම් නිශ්චිත කාර්යයක් සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම අවශ්‍යවන්නා වූ ද ඒ කාර්යය සඳහා ඒ දේපළ අත්කර ගැනීම අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අනුමත කරනු ලබන්නා වූ ද අවස්ථාවක, ඒ දේපළ, ඉඩම් අත්කර ගැනීමේ පනත අදාළවීමේ කාර්යය සඳහා, පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය සේ සැලකිය යුතු අතර, ඒ අනුව එය ඒ පනත යටතේ අත්කරගෙන අධිකාරිය වෙත පවරා දෙනු ලැබිය හැකි ය.

(2) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අධිකාරිය සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන යම් මුදලක්, අධිකාරිය විසින් ගෙවනු ලැබිය යුතු ය.

චංචල හා නිශ්චල දෙආකාරයේ ම රජයේ දේපළ අධිකාරියට ලබාදිය යුතු බව.

37. (1) රජයේ යම් නිශ්චල දේපළක් අධිකාරියේ යම් කාර්යයක් සඳහා අවශ්‍ය වන අවස්ථාවක, ඒ කාර්යය රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ ඒ දේපළ විශේෂ ප්‍රදානයක් කළ හැකි හෝ බද්දක් දිය හැකි කාර්යයක් ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව, ඒ ආඥාපනතේ විධිවිධාන, ඒ දේපළ සම්බන්ධයෙන් අධිකාරිය වෙත කෙරෙන විශේෂ ප්‍රදානයකට හෝ බදු දීමකට හෝ අදාළ විය යුතු ය.

(2) රජයේ යම් චංචල දේපළක් අධිකාරියේ කාර්ය සඳහා අවශ්‍ය වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ඒ චංචල දේපළෙහි සන්තකය හා පාවිච්චිය, අධිකාරිය වෙත පවරා සතු කර දිය හැකි ය.

සිවිල් හෝ අපරාධ නඩුවල දී දැරූ වියදම් අරමුදලින් ගෙවිය යුතු බව.

38. (1) යම් අධිකරණයක් ඉදිරිපිට අධිකාරිය විසින් හෝ අධිකාරියට විරුද්ධව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, අධිකාරිය විසින් දැරූ යම් වියදමක් අධිකාරියේ අරමුදලින් ගෙවිය යුතු අතර, යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරිය වෙත ගෙවන ලද හෝ අධිකාරිය විසින් අයකර ගන්නා ලද යම් නඩු ගාස්තුවක්, අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ අධිකාරියේ යම් සාමාජිකයකු, අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් ඉදිරියේ ඔහුට හෝ ඇයට විරුද්ධව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, එම ක්‍රියාව සද්භාවයෙන් කරනු ලැබ ඇතැයි අධිකරණය තීරණය කරන්නේ නම්, ඒ නඩුවේ දී දරන ලද යම් වියදමක්, එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු හෝ ඇය විසින් අයකරගනු ලැබුවේ නම් මිස, අධිකාරියේ අරමුදලින් ඔහුට හෝ ඇයට ගෙවනු ලැබිය යුතු ය.

නියෝග.

39. (1) නියෝග සෑදිය යුතු යයි මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇති යම් කාරණයක් සම්බන්ධයෙන්, අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් ම හා (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, අමාත්‍යවරයා විසින්, අධිකාරිය විමසා-

(අ) අධිකාරිය විසින් සපයනු ලබන විවිධ සේවා හා පහසුකම් සඳහා, අය කළ යුතු ගාස්තු තීරණය කිරීම සඳහා මාර්ගෝපදේශ නියම කරමින් ; සහ

(ආ) 7 වන වගන්තිය යටතේ අධිකාරිය විසින් බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කාර්ය කිරීමේ දී සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී අවශ්‍ය විය හැකි වෙනත් යම් කරුණක් සම්බන්ධයෙන්

නියෝග සාදනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළ කරනු ලැබූ දින සිට හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින්, පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, එහි අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

රීති.

40. (1) රීති සෑදීමට මේ පනතින් නියම කර ඇති නැතහොත් බලය පවරා ඇති සියලු කාරණා හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන්, අධිකාරිය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද කිසිම රීතියක්, එය අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ, ඒ අනුමතය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තෙක්, බලාත්මක නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

41. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

42. මේ පනතෙහි පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස–

"පනත" යන්නෙන් මේ පනත අදහස් වන අතර ඊට මේ පනත යටතේ සාදන ලද නියෝග හා රීති ද ඇතුළත් වේ ;

"ගගන යාත්‍රාංගනය" යන්නෙන්, ගගන යානා බැස්සවීම සහ පිටත්කර යැවීම සඳහා සම්පූර්ණයෙන් වුව ද නැතහොත් අර්ධ වශයෙන් වුව ද භාවිත කිරීමට අදහස් කෙරෙන යම් භූමි හෝ ජල ප්‍රදේශයක් සහ ඒ මත පිහිටි හෝ ඊට අනුබද්ධිත සියලු ගොඩනැගිලි, මඩු, යාත්‍රා, ගොඩ බසින පාලම් හා වෙනත් ඉදිකිරීම් අදහස් වේ ;

"ගුවන් සංතරණ පනත" යන්නෙන් (365 වන අධිකාරය වූ) ගුවන් සංතරණ පනත අදහස් වේ ;

"සම්මුතිය" යන්නෙන් 1944 දෙසැම්බර් මස 07 වන දින චිකාගෝහි දී අත්සන් තබන ලද ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා පිළිබඳ සම්මුතිය අදහස් වේ ;

"පිළිගත් ප්‍රමිති" යන්නෙන්, සම්මුතියේ 37 වන වගන්තිය යටතේ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ සභාව විසින් සම්මත කරගන්නා ලද්දා වූ ද, එම සම්මුතියේ 38 වන වගන්තිය යටතේ ප්‍රතිවිරෝධයක් ශ්‍රී ලංකාව විසින් ගොනු කර නොමැත්තා වූ ද ප්‍රමිතීන් සහ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ සභාව විසින් සම්මුතියේ 37 වන වගන්තිය යටතේ සම්මත කරගන්නා ලද්දා වූ හා ශ්‍රී ලංකාවෙහි යථා පරිදි ක්‍රියාත්මක කර බලාත්මක කර ඇත්තා වූ නිර්දේශිත පරිචයන් ද අදහස් වේ ;

"එස්.ඩී.ආර්." යන්නෙන්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් විග්‍රහ කරනු ලැබූ පරිදි වූ විශේෂ ගැණුම් හිමිකම් අදහස් වේ.

43. (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, ගුවන් සංතරණ පනතේ 20 වන වගන්තිය යටතේ පත් කරන ලද සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම පනත යටතේ ක්‍රියාත්මක කරනු ලබන එම පනත යටතේ වූ බලතල සහ කරනු ලබන කාර්ය සහ ඉටු කරනු ලබන කර්තව්‍ය, නියමිත දින සිට හා එදිනට පසුව සහ එම ගුවන් සංතරණ පනත බලාත්මකව පවතින තාක්කල් සහ එතෙකුදු පමණක්, මේ පනතේ 11 වන වගන්තිය යටතේ පත් කරනු ලබන සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීම කළ යුතු අතර, ගුවන් සංතරණ පනතේ 20 වන වගන්තිය යටතේ පත් කරන ලද සිවිල් ගවන් සේවා අධ්‍යක්ෂ

ගුවන් සංතරණ පනත යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල ආදිය 11 වන වගන්තිය යටතේ පත් කරනු ලබන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ක්‍රියාත්මක කළ යුතු බව.

ජනරාල්වරයා විසින් නියමිත දින සහ එදිනට පසුව එම බලතල ක්‍රියාත්මක කරනු ලැබීම ද, කාර්ය කරනු ලැබීම සහ කර්තව්‍ය ඉටු කරනු ලැබීම ද නතර කළ යුතු ය.

(2) ගුවන් සංතරණ පනත මගින් හෝ එම පනත යටතේ අමාත්‍යවරයා වෙත පැවරී තිබුන, පනවා තිබූ හෝ සතුකර තිබූ යම් බලතල, කාර්ය සහ කර්තව්‍ය ඒ පනතේ 20 වන වගන්තිය යටතේ පත් කරන ලද සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පැවරීම සඳහා අමාත්‍යවරයා වෙත බලය ප්‍රදානය කළ ගුවන් සංතරණ පනතේ 21 වන වගන්තියේ විධිවිධාන, ඒ පනත බලාත්මකව පවතින තාක්කල් හා එතෙකුදු පමණක් ඒ බලතල, කාර්ය සහ කර්තව්‍ය මේ පනතේ 11 වන වගන්තිය යටතේ පත්කරන ලද සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පැවරීම සඳහා අමාත්‍යවරයා වෙත පවරන ලද බලයක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.

පළමුවන උපලේඛනය (3(5) වන වගන්තිය)

අධිකාරියට හා එහි සාමාජිකයන්ට අදාළ විධිවිධාන

1\. යම් තැනැත්තකු-

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන සභාවක සභිකයකු වන්නේ නම් හෝ එසේ වුවහොත් :

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ පුරවැසියකු වීම නැවති ඇත්නම් :

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු ලෙස නිරණය කරනු ලැබ හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්නම් :

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක විසින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් විඳිමින් සිටි නම් හෝ විඳ ඇත්නම් : හෝ

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවතින යම් නීතියක් යටතේ බංකොලොත් පුද්ගලයකු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ බංකොලොත් භාවයෙන් නිදහස් කරනු ලැබ නැත්නම්.

ඒ තැනැත්තා (මේ උපලේඛනයේ "පත් කළ සාමාජිකයා" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයකු ලෙස මේ පනතේ 3(1) (ආ) වගන්තිය යටතේ පත් කරනු ලැබීමට හෝ අධිකාරියේ පත්කළ සාමාජිකයකු ලෙස දිගටම කටයුතු කිරීමට හෝ නුසුදුස්සකු විය යුතු ය.

2. පත්කළ සාමාජිකයකු, මියයෑම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා ඔහු කලින් ධුරය අත්හරිනු ලැබුවහොත් මිස, පත්වීමේ දිනයේ සිට අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර ඔහු එම ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කිරීම සඳහා සුදුස්සකු වන්නේ ය.

3. අමාත්‍යවරයා විසින්, තත් කාර්ය සඳහා හේතු දක්වා, අධිකාරියේ පත්කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

4. අධිකාරියේ පත් කළ සාමාජිකයකු විසින් තත් කාර්ය සඳහා අමාත්‍යවරයා අමතන ලිපියක් මගින් සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලිඛිතව භාර ගැනීමේ අවස්ථාවේ සිට එය බලාත්මක විය යුතු ය.

5. අධිකාරියේ පත් කළ සාමාජිකයකු මියයෑම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම මගින් ධුරය අත්හළ අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් මේ පනතේ 3(1)(ආ) සහ 3(3) වගන්ති සැලකිල්ලට ගෙන ඒ සාමාජිකයා වෙනුවට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය. ඒ පත්කළ සාමාජිකයා වෙනුවට එසේ පත්කරනු ලැබූ තැනැත්තා, තමා අනුප්‍රාප්තවන සාමාජිකයාගේ ඉතිරි ධුර කාලය සඳහා ධුර දැරිය යුතු ය.

6. අසනීපවීම නිසා හෝ අබලතාව නිසා හෝ මාස තුනකට නො අඩු කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ යම් පත්කළ සාමාජිකයකුට සිය ධුරයේ කාර්ය තාවකාලිකව ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, ඒ අපහසුතාව පිළිබඳව අමාත්‍යවරයාට ලිඛිතව දැන්වීම ඒ සාමාජිකයාගේ කාර්ය වන්නේ ය. ඉන්පසු අමාත්‍යවරයා විසින් මේ පනතේ 3(1)(ආ) සහ 3(3) වගන්ති වල විධිවිධාන සැලකිල්ලට ගෙන ඒ කාලය තුළ ඔහු වෙනුවට ක්‍රියා කිරීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

7. අමාත්‍යවරයා විසින් මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා නිශ්චය කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයන්, අධිකාරියේ සාමාජිකයන් රැස්වීම්වලට පැමිණීම සම්බන්ධයෙන් අධිකාරියේ අරමුදලින්, ඔවුන්ට ගෙවනු ලැබිය හැකි ය.

8. (1) සභාපතිවරයා විසින්, තමා විසින් ම හෝ අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයාගේ ඉල්ලීම පිට, සාමාජිකයන්ගේ රැස්වීමක් කැඳවිය යුතු ය.

(2) සභාපතිවරයා පැමිණ සිටිනම් සභාවේ සෑම රැස්වීමක දී ම ඔහු මූලසුන දැරිය යුතු ය. එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි විටක, උප සභාපතිවරයා හෝ උපසභාපතිවරයා නොපැමිණි විටක සභාපතිවරයා විසින් නම් කරනු ලබන වෙනත් යම් සාමාජිකයකු හෝ ඒ රැස්වීමේ මූලසුන දැරිය යුතු ය.

(3) අධිකාරියේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් හතර දෙනකු විය යුතු ය.

(4) අධිකාරියේ යම් රැස්වීමක දී මූලසුන දරන තැනැත්තාට, තමාගේම ඡන්දයට අමතරව, තීරණ ඡන්දයක් තිබිය යුතු ය.

(5) මේ ඡේදයේ විධිවිධානවලට යටත්ව, අධිකාරියේ රැස්වීම්වලට අදාළ කාර්ය පටිපාටිය ද, ඒ රැස්වීම්වල කටයුතු කිරීම ද, අධිකාරිය විසින් පාලනය කළ යුතු ය.

9. අධිකාරියේ සාමාජිකත්වයේ පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසාම පමණක හෝ එහි යම් සාමාජිකයකු පත්කිරීමේ යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් හෝ අධිකාරියේ යම් ක්‍රියාවක්, තීරණයක් හෝ ක්‍රියා පටිපාටියක් අවලංගු වන්නා සේ නොසැලකිය යුතු ය.

10. (1) අධිකාරියේ මුද්‍රාව, අධිකාරිය විසින් තීරණය කොට සකස් කර ගත ලැබිය යුතු අතර, අධිකාරිය විසින් තීරණය කරනු ලබන ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය.

(2) අධිකාරියේ මුද්‍රාව අධිකාරිය විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි යම් තැනැත්තකුගේ භාරයේ තිබිය යුතු ය.

(3) අධිකාරියේ මුද්‍රාව, අධිකාරියේ අනුමතිය ඇතිව සහ අධිකාරියේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, ඒ සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එම සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු ය.

(4) අධිකාරියේ මුද්‍රාව තැබූ සාධන පත්‍ර හා ලේඛන පිළිබඳ රෙජිස්ටරයක් අධිකාරිය විසින් පවත්වාගෙන යා යුතු ය.

දෙවන උපලේඛනය (9 වන වගන්තිය)

ගගන යාත්‍රාංගන

1. කටුනායක ගුවන් තොටුපොළ
2. රත්මලාන ගුවන් තොටුපොළ
3. පලාලි ගුවන් තොටුපොළ
4. අම්පාර ගුවන් තොටුපොළ
5. මඩකලපුව ගුවන් තොටුපොළ
6. අනුරාධපුර ගුවන් තොටුපොළ
7. වීරවිල ගුවන් තොටුපොළ
8. පුත්තලම ගුවන් තොටුපොළ
9. කොග්ගල ගුවන් තොටුපොළ
10. සීගිරිය ගුවන් තොටුපොළ
11. කටුකුරුන්ද ගුවන් තොටුපොළ
12. වවුනියාව ගුවන් තොටුපොළ
13. ත්‍රිකුණාමලය ගුවන් තොටුපොළ
14. හිඟුරක්ගොඩ ගුවන් තොටුපොළ

තුන්වන උපලේඛනය (9 වන වගන්තිය)

1. රත්මලාන කැලවල පාරේ පිහිටි සිවිල් ගුවන් සේවා පුහුණු මධ්‍යස්ථානය, එහි ගොඩනැගිලි හා ඉදිකිරීම් සහ ඊට ආබද්ධ ඉඩම.

2. රත්මලාන, අත්තිඩියේ පිහිටි ගගන නාවික සන්නිවේදන සම්ප්‍රේෂණාගාරය, එහි ගොඩනැගිලි හා ඉදිකිරීම් සහ ඊට ආබද්ධ ඉඩම.

3. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සඳහා ගම්පහ, මඩම්පැල්ලේ පිහිටුවා ඇති, ගුවන් විදුලි සංතරණ උපකාරක, එහි ගොඩනැගිලි හා ඉදිකිරීම් සහ ඊට ආබද්ධ ඉඩම.

4. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි ධාවන පථය සඳහා ගම්පහ, පමුණුගම, කැපුන්ගොඩ පිහිටුවා ඇති ගුවන් විදුලි සංතරණ උපකාරක, එහි ගොඩනැගිලි හා ඉදිකිරීම් සහ ඊට ආබද්ධ ඉඩම.

5. බත්තරමුල්ල, තලංගම පිහිටි ගගන නාවික සන්නිවේදන භූවමාරු ස්ථානය, එහි ගොඩනැගිලි හා ඉදිකිරීම් සහ ඊට ආබද්ධ ඉඩම.

6. පිදුරුතලාගල කන්දේ පිහිටුවා ඇති රේඩාර් ස්ථානය, එහි ගොඩනැගිලි හා ඉදිකිරීම් සහ ඊට ආබද්ධ ඉඩම.

7. ගුවන් සේවා කාර්ය මණ්ඩලය සඳහා නිවාඩු නිකේතනය ඉදිකර තිබෙන නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිදුරුතලාගල පිහිටි ඉඩම, එහි ඇති හෝ ඊට ආබද්ධ කවර හෝ ඉදිකිරීම් ද ඇතුළුව

8. අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 249 "ආ" පියවර කොටස ග්‍රාම නිලධාරි කොට්ඨාසය සීමාවට අයත් අනුරාධපුර නව නගරයේ කැබලි අංක 976 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.125 ක් පමණ වූ ඉඩම් කොටස.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.